CoViD-19 තත්ත්වය යටතේ නිවසට ම වී සිටින දරුවන්ගේ අධ්‍යාපනය නගාසිටුවීම සඳහා අත්වැලකි.

**ඉතා වැදගත්**

**නිවසේ සිට පිළිතුරු ලිවීම සඳහා පමණි**

2021 සැප්තැම්බර් 7 දින සිට සැප්තැම්බර් 10 දින දක්වා සුදුසු දිනයක නියමිත වේලාවක් තෝරාගෙන පිළිතුරු සපයන්න.

# සිසු සවිය 2021

## 5 වන ශ්‍රේණියේ දූ පුතුන්ට අත්වැලක්

**5**

**පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය**

**සබරගමු පළාත.**

II පත්‍රය.

## නිවාඩුවට අරුතක්... පෙරහුරු පරීක්ෂණය

පැය 01 මිනිත්තු 15 යි.

නම:.................................................................................................................................

## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි...

| | |
|---|---|
| I පත්‍රය ලකුණු | : |
| II පත්‍රය ලකුණු | : |
| මුළු ලකුණු | : |

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්න වල එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.

## විශේෂ අවධානය පිණිස...

පාසල්වල විදුහල්පතිවරු පංති භාර ගුරු මහත්ම/මහත්මීන් වෙත...

- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රණයකොට හෝ පිටපත් කර සැප්. මස 7 වන දිනට පෙර ඔබ පාසලේ 5 ශ්‍රේණියේ ඉගෙනුම් ලබන සෑම දරුවෙකුටම ප්‍රශ්න පත්‍රය ලබාදීමට කටයුතු කරන්න.
- ගැටලුවක් ඇතොත් කොට්ඨාසයේ ප්‍රාථමික ගුරු උපදේශක, කලාප විෂය අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශය අමතන්න.
- පිළිතුරු පත්‍රය කලාප කාර්යාලය මගින් ඔබට ලබාගත හැකිය. ලකුණු දුරකතනය මගින් ලබාගෙන සාරාංශ වාර්තාවක් සකස් කරන්න. පිළිතුරු ගැන දෙමාපියන්ට ගැටළුවක් ඇතොත් පංතිභාර ගුරුවරුන්ගේ සහාය ලබාගන්න.
- වෙනත් පළාතක, කලාපයක දරුවෙකුට වුවද මෙය ලබාදීමට කටයුතු කරන්න.
- මේ සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

**- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය -**

දයාබර දෙමව්පියනි,
ආදරණීය දුවේ පුතේ...

කොවිඩ් වසංගතය හේතුවෙන් නිවාඩු කාලයේ නිවසේ සිටින 5 ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් මෙම පෙරහුරු ප්‍රශ්න පත්‍රය ලබාදෙනු ලැබේ.

**2021 සැප්තැම්බර් 7 දින සිට සැප්තැම්බර් 10 දින දක්වා සුදුසු දිනයක නියමිත වේලාවක් තෝරාගෙන නිවසේ සිට පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.**

| I පත්‍රය | II පත්‍රය |
|---|---|
| පැය 01 යි. | පැය 01 යි මිනිත්තු 15 යි. |

- නිවසේ සුදුසු ස්ථානයන් තෝරාගෙන පිළිතුරු ලිවීමට අවස්ථාව සලසා දෙන්න.
- කිසිදු අනවශ්‍ය පීඩනයක් ඇති නොවන ආකාරයට දරුවන්ට මෙය ලිවීමට අවස්ථාව ලබාදෙන්න.
- මෙදිනට කිරීමට අපහසුවන දරුවන් සඳහා ද මෙය පසු දිනක කළ හැකි බව ද දන්වමි.
- ඉතාමත් සතුටින් හා විනෝදයෙන් මෙම ප්‍රශ්න පත්‍රය ලිවීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය -**

01. **පහත දැක්වෙන ඡේදය කියවන්න.**

දුමිදු, රුවනි සහ කාවින්ද්‍යා වෙල් ඉපනැල්ලේ සෙල්ලම් කරමින් සිටියෝ ය. හදිස්සියේ ම හමා ආ සුළඟත් සමඟම වැසි වැටෙන්න ට පටන් ගත්තේ ය. ගත වුයේ සුළු මොහොතකි. එක විටම මොර සූරණ වර්ෂාවක් ඇද හැළෙන්න ට පටන් ගත්තේ ය. එසැනින් ම ක්‍රියාත්මක වූ දිමිදු අහල පහල පැල්පතක් තිබේ ද යන්න සොයන්න ට පටන් ගත්තේ ය. පැල්පතක් නොතිබූ නිසා අසල තිබූ විශාල හබරල ගසින් කොළ තුනක් කඩාගෙන ආවේ ය. අනතුරුව තිදෙනා හබරල අතු යටින් වැස්ස ට නොතෙමී නිවෙස් කරා දිව ගියෝ ය.

**ඡේදය ඇසුරෙන් පිළිතුරු ලියන්න.**

(i) තිදෙනා සෙල්ලම් කරමින් සිටියේ කොහේ ද?

..............................................................................................................

(ii) ''අධික වැස්සක්'' යන්න ඡේදයේ යෙදී ඇති වාක්‍යය කුමක් ද?

..............................................................................................................

(iii) ඡේදයේ සඳහන් ව ඇති යුගල පදයක් ලියන්න.

..............................................................................................................

(iv) තිදෙනා වැස්ස ට නොතෙමී නිවෙස් කරා ගියේ කෙසේ ද?

..............................................................................................................

(v) දීර්ඝ පාපිල්ල යෙදුණු වචනයක් ඡේදයෙන් සොයා ලියන්න.

..............................................................................................................

(vi) අතීතකාල බහුවචන ආඛ්‍යාත පදයක් ඡේදයෙන් සොයා ලියන්න.

..............................................................................................................

**02. දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.**

i . වස්තුහාමි / කාර්යශූර / පුද්ගලයෙකි / වූ / ගොවියෙකු / ධනවත්

..............................................................................................................

**03. ප්‍රාණවාචී අතීතකාල බහුවචන ක්‍රියාපදයක් තෝරා යටින් ඉරක් අඳින්න.**

බැලුවේ ය. / කැඩුවා ය. / කරති. / කෑවෝ ය.

**04. පහත සඳහන් එක් එක් වගන්තියේ උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

i. ඔහු ඉරිදා උදේ පොළට යති. ( )

ii. හංසයෝ දියේ පීනති ( )

iii. අපි ලස්සන ට අකුරු ලියමි. ( )

iv. ඔවුහු ඉවසීමෙන් කටයුතු කළෝ ය. ( )

**05. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

ඔයාලා කැමති එහෙම ද මුල් ගුරුතුමා විමසුවේ ය

**06.** i. **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචනය හිස්තැනෙහි ලියන්න.**

ආඬි හත්දෙනාගේ .................................. වගේ.

ii. පහත දැක්වෙන අවස්ථාව ට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.
ගැළපෙන අදහස් හා ගතිගුණ තිබීම.

..............................................................................................................

**07.** **පහත දැක්වෙන එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

i. (නෙළුම් මල / නෙලුම් මල) උදෑසන පිපී සුවඳ හමයි.

ii. බැංකු (කළමණාකරු/කලමණාකරු) සභාව ඇමතී ය.

iii. කාර්යාලවල(ආපණ ශාලා/ආපන ශාලා) කොවිඩ් වසංගතය නිසා තාවකාලිකව වසා ඇත.

**08.** **පහත ඉඟි වැකියට ගැළපෙන අදහස ලියන්න.**

i. මුරුංගා අත්තේ තියනවා.

..............................................................................................................................

**09.** **ඉරි ඇඳි අක්ෂරය ට අදාළ පිල්ලම් ලියන්න.**

i. <u>බෝ</u>තලය - ..............................................................................................

i. ක<u>රු</u>ණාව - ..............................................................................................

**10.** **පහත ආප්තෝපදේශයට ගැළපෙන අදහස ලියන්න.**

i. උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා

..............................................................................................................................

**11.** i. **මෙම කවියේ ඇති උපමාව යටින් ඉරක් අඳින්න.**

**මගේ සුරතල් අක්කාගේ - මාලේ මුතු ඇට වාගේ**

**මේ වැටෙන්නේ පිනි බින්දුත් - හඳමු එකක් ඒ වාගේ**


ii. ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.

කවියා - ..............................................................................................................

(ලකුණු 26)

12. **එක් එක් රූපය ට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

i.  ……………………

ii.  ……………………

**13.** **එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.**

i. Rabbit - ...............................................................

ii. waterfall - ...............................................................

**14.** **පහත දී ඇති වාක්‍යවල හිස්තැන ට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

i. I am ......................... (eat / eating) a mango.

ii. This ...........................(is / are) my pen.

15. i. ''නණ්බි'' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

……..………..............................................................................................................

ii. පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මට මල්ලි කෙනෙක් ඉන්නවා -..........................................................................................

(ලකුණු 08)

16. '' **ක්ලැරිබෙල් මම වෙමි''** යන මාතෘකාව යටතේ උක්ත ආඛ්‍යාත ගළපමින් අර්ථවත් වැකි 03ක් ලියන්න. (එක් වැකියකට වචන 5 කට වඩා වැඩි විය යුතුය. උක්ත ආඛ්‍යාත සම්බන්ධ හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.)

i. ………………...……………………………………………………………...………………………..

………………...……………………………………………………………...………………………..

ii. ………………...……………………………………………………………...………………………..

………………...……………………………………………………………...………………………..

iii. ………………...……………………………………………………………...………………………..

………………...……………………………………………………………...………………………..

(ලකුණු 06)

- **නිවැරදි පිළිතුරු හිස්තැන් මත ලියන්න.**

17. i. ''**හතළිස් දහස් පහ**'' ඉලක්කමෙන් ලියන්න -.........................................................

ii. 6 2 3 6 4 රවුම් කළ සංඛ්‍යාවේ ස්ථානීය අගය ලියන්න.

.........................................................................................................................................

18. i. පහත සංඛ්‍යා අවරෝහණ පිළිවෙළ ට ලියන්න.


4978 , 4789 , 4879 , 4897 - .........................................................................................

19. කොටුවේ ඇති සංඛ්‍යා සියල්ල ම යොදාගෙන පොදු අන්තරය 6 වන සංඛ්‍යා රටාවක් ගොඩ නගන්න.

| | | |
|---|---|---|
| 100 | 94 | 88 |
| 82 | 106 | |

82 , ……………………………………………………………………

20.




i. පාට කළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න.

……………………………………………………………………

ii. පාට නොකළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

……………………………………………………………………

21. i. මෙහි $\frac{3}{4}$ ක් අඳුරු කර දක්වන්න.



ii. අඹ ගෙඩි 84 න් ½ කීය ද?. - ..................................................................

22. අභ්‍යාස පොත් 878 කි. එයින් පාර්සල් 5 ක් සෑදිය යුතු ය.

i. එක පාර්සලයක අභ්‍යාස පොත් කීය ද?. ..................................................................


ii. ඉතිරි අභ්‍යාස පොත් ගණන කීය ද? ..................................................................

23. බස් රථය කොළඹින් පෙ.ව. 10.45 ට පිටත් ව ප.ව. 5.35 ට පොළොන්නරුව ට ළඟා විය.

i. බස් රථය පොළොන්නරුව ට ළඟා වූ වේලාව පැය 24 ඔරලෝසුවෙන් ලියන්න.

..............................................................................................................................

ii. ගමනට ගත වූ කාලය කොපමණ ද? ..................................................................

24. 

i. මෙම ඝන වස්තුවේ නම කුමක් ද?. ..................................................


ii. මෙහි දාර කීය ද? ..................................................................

iii. මෙහි මුහුණත් ගණන කීය ද? ..................................................

25. පහත රෝම සංඛ්‍යාංකයේ පෙර හා පසු සංඛ්‍යාව ලියන්න.

....................viii..................

26. ශ්‍රී ලංකාවේ නගර කීපයක දුර පහත දැක් වේ.




i. මීගමුවේ සිට හලාවත ට දුර කීය ද? ..........................................................

ii. කොළඹ සිට හලාවතට ගොස් නැවත කොළඹ ට ඒම ට කුමාර ට කොපමණ දුරක් යා යුතු ද? ..........................................................

27. **අයියාගේ බර 56kg 250g - මල්ලීගේ බර 32kg 750g**

i. අයියා සහ මල්ලී ගේ මුළු බර කොපමණ ද? ..........................................................

ii. මල්ලීට වඩා අයියා කොපමණ බරින් වැඩි ද? ..........................................................


28. i. පහත බිල්පත සම්පූර්ණ කරන්න.


| ද්‍රව්‍ය | මිලට ගත් ප්‍රමාණය | 1kg ක මිල රු. | 1kg ක මිල සත | වටිනාකම රු. | වටිනාකම සත |
|---|---|---|---|---|---|
| සීනි | 250g | 220 | . 00 | .............................. | |
| අල | .............................. | 280 | . 00 | 140 | . 00 |
| පරිප්පු | 500g | .............................. | | 175 | . 00 |
| | | | **මුළු මුදල** | .............................. | |

ii. ඉහත බිල්පත සඳහා රු. 1000.00 ක මුදලක් දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීය ද?.

……………………………………………………

29. පහත රූපවල ඇඳිය හැකි සමමිතික රේඛා ගණන ලියන්න.

i.  ..................

ii.  ..................

(ලකුණු 30)

✷ **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නය ට සුදුසු පිළිතුරු දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

30. ''මම මගේ නිවස ට ආලෝකයක් වෙමි.'' සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ කී වෙනි පියවර ට අයත් ද?

1. ප්‍රාර්ථනාව 2. අධිෂ්ඨානය 3. උදානය

31. දිනපතා ජලය පානය කිරීමෙන් අපට ලැබෙන වාසියකි.

1. මුත්‍රා කිරීමේ අපහසුව 2. වකුගඩු නිරෝගී වීම 3. සම පැහැපත් නොවීම

32. ''දොන් පුල්ලේ වෙදරාල'' නමින් හැඳින්වුයේ,

1. මොනරවිල කැප්පෙටිපොළ දිසාව
2. වීර පුරන් අප්පු
3. ගොංගාලේ ගොඩ බණ්ඩා

33. රාජ්‍ය ලාංඡනයේ පුන්කලසින් නිරූපණය වන්නේ,

1. සෞභාග්‍යය හා පරිපූර්ණ බව 2. ස්වයංපෝෂිත බව 3. සශ්‍රීකත්වය

34. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය හා ජාතික සත්ත්වයා පිළිවෙළින්,

1. නිල් මානෙල් හා දඬුලේනා 2. මානෙල් හා දඬුලේනා 3. නිල් මානෙල් හා වලිකුකුළා

35. සර්ව භක්ෂක සතුන් යනුවෙන් හඳුන්වනු ලබන්නේ,


1. සත්ත්ව කොටස් පමණක් ආහාරය ට ගන්නා සතුන්
2. ශාක කොටස් පමණක් ආහාරය ට ගන්නා සතුන්
3. ශාක හා සත්ත්ව කොටස් දෙවර්ගයම ආහාරය ට ගන්නා සතුන්

36.  මෙම පරීක්ෂණයෙන් පැහැදිලි වන්නේ,

1. චුම්භකවල ආකර්ෂණය
2. චුම්භකවල විකර්ෂණය
3. චුම්භකවල ආකර්ෂණය හා විකර්ෂණය

37. පහත රූපය සිදුරු කැමරාවකින් බැලූවිට පෙනෙන ආකාරය,



1.  2.  3. 

38. ගෙවත්තේ බෝග පැළ අතර දාස්පෙතියා ශාක වගා කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ,

1. ගෙවත්ත ට අලංකාරයක් එක් කිරීමයි.
2. බෝගවල ට හානි පමුණුවන සතුන් පළවා හැරීම
3. ගෙවත්තෙහි ඉඩකඩ උපරිම ලෙස ප්‍රයෝජනය ට ගැනීම

39. පහත දැක්වෙන ස්ථාන අතුරෙන් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත්තේ කුමක් ද?

1. සිංහරාජ වනාන්තරය

2. යාල අභයභූමිය

3. පේරාදෙණිය උද්භිත උද්‍යානය


40. ජල රෝදයේ කරකැවීමේ වේගය වැඩි කිරීම ට කළ හැකි දෙයකි,

1. ජල පහරේ වේගය වැඩි කිරීම

2. ජල පහරේ වේගය අඩු කිරීම

3. ජල රෝදයේ පෙති ගණන අඩු කිරීම

41. පහත දැක්වෙන රූපය හඳුනාගෙන නම් කරන්න.



1. අනිලමානය

2. සුළං දිශා දර්ශකය

3. වර්ෂාමානය

42. බීම වර්ගයක් ලෙස සාදා ගැනීම ට අවශ්‍ය වන දෙය ඇතුළත් පිළිතුරකි,

1. වෙරළු , කැකිරි , නෙල්ලි

2. රණවරා, ඉරමුසු, බෙලිමල්

3. දොඩම්, ඉරමුසු, හාතාවාරිය

43. වැඩිම ජල ප්‍රමාණයක් මුහුද ට ගෙන යන ගංගාව සහ එය මුහුද ට වැටෙන පළාත,

1. ගිංගඟ, දකුණු පළාත

2. මහවැලි ගඟ, මධ්‍යම පළාත

3. කළු ගඟ , බස්නාහිර පළාත

44. මෙම උපකරණ භාවිතා කරන කර්මාන්ත පිළිවෙළින්





1. පෙදරේරු සහ වඩු කර්මාන්තය

2. කම්මල් සහ කෘෂි කර්මාන්තය

3. කෘෂි කර්මාන්තය සහ වඩු කර්මාන්තය

45. වගාවේ දී භාවිතා කරන 3R සංකල්පය ලෙස හඳුන්වන ලද්දේ,

1. භාවිතය අවම කිරීම, නැවත භාවිතා කිරීම, ප්‍රතිචක්‍රීකරණය

2. ඉවත් කිරීම, අවම කිරීම, ප්‍රතිචක්‍රීකරණය

3. පිළිස්සීම, බඳුන්ගත කිරීම, ප්‍රතිචක්‍රීකරණය

46. ශ්‍රී ලංකාවේ මුල් ම වැව හා සෑදූ රජු වන්නේ,

1. බසවක්කුලම , පණ්ඩුකාභය රජ

2. අභය වැව , දුටුගැමුණු රජු

3. මින්නේරිය වැව , මහසෙන් රජ

47. වගාව ට හානි කරන කුරුල්ලන් හා වෙනත් සතුන් පලවා හැරීම ට භාවිතා කරන ඇටවුමකි,

1. බඹර රෝදය 2. ජල රෝදය 3. සුළං ටකය

48. අයිස් කැට ප්‍රායෝගිකව යොදා ගන්නා අවස්ථාවකි,

1. පලා වර්ගවල නැවුම් බව රැක ගැනීමට

2. මාළු නරක් නොවී කල්තබා ගැනීමට

3. වියළි ආහාර ද්‍රව්‍ය නරක් නොවී තබා ගැනීමට

49. චුම්බකය ට ඇදගන්නා (ආකර්ෂණය වන) දෙයකි,

1. ඊයම් කම්බි 2. පිත්තල කම්බි 3. වානේ කම්බි

50. 


මෙම ඇටවුමට චුම්බක ශක්තිය වැඩි කිරීමට කළ හැකි දෙයකි.

1. වියළි කෝෂ ගණන අඩු කිරීම

2. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය වැඩි කිරීම

3. කොයිල් කම්බි ඔතන ප්‍රමාණය අඩු කිරීම


51. තුරංගා වන්නමෙන් සහ ගජගා වන්නමෙන් කියැවෙන සතුන් පිළිවෙළින්,

1. හාවා සහ ඇතා 2. වඳුරා සහ නයා 3. අශ්වයා සහ ඇතා

52. ශරීරයේ හටගත් තුවාල සුව වීම ට ප්‍රමාද වන්නේ,

1. විටමින් A ඌනතාවය 2. විටමින් C ඌනතාවය 3. විටමින් D ඌනතාවය

53. මෙම හිස් භාජනය ට ජලය දමා පිරවීමෙන් පසු නම් කර ඇති සිදුරු අතරින් වැඩි දුරකට ජලය විදින්නේ,




1. A සිදුරෙන්

2. B සිදුරෙන්

3. C සිදුරෙන්

54. ඇස හා කණ උපයෝගී කර ගෙන තොරතුරු ලබා ගත හැකි උපකරණයකි,

1. ගුවන් විදුලිය 2. රූපවාහිනිය 3. ශබ්ද විකාශන යන්ත්‍ර

55. කැල්සියම් බහුල ආහාර කාණ්ඩය ට අයත් වන්නේ,

1. නෙලුම් අල, තල , බිත්තර 2. කොස්,දෙල්,රටකජු 3. කෙසෙල්,අඹ,නිවිති

56. ශ්‍රී ලංකාව ට ආවේණික වූ ක්ෂීරපායී සත්ත්ව කාණ්ඩයට අයත් වේ.

1. දියනයා, කළු වඳුරා, මල් පුලුට්ටා

2. වවුලා, හික්මීයා, දියනයා

3. කළු වඳුරා, කලවැද්දා, හික්මීයා

57. අපවිත්‍ර ජලය පානය කිරීමෙන් වැළඳෙන රෝගයක් නොවන්නේ,

1. අක්මා ප්‍රදාහය 2. කහ උණ 3. ඩෙංගු

58. කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා ගමන් කරන දුම්රිය මාර්ගය හඳුන්වන්නේ,

1. උඩරට දුම්රිය මාර්ගය

2. කැලණිවැලි දුම්රිය මාර්ගය

3. මුහුදු බඩ දුම්රිය මාර්ගය

59. තවාන් මගින් පැළ ලබා ගන්නා ශාක පමණක් ඇති පිළිතුර වන්නේ,

1. වම්බටු , මාළුමිරිස් 2. බතල, නිවිති 3. බණ්ඩක්කා, බෝංචි

(ලකුණු 30)